# ප්‍රසම්පාදන දැන්වීමයි.

## සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව සතු සති පොළවල් 2025 වර්ෂයට බදු දීම සඳහා මිල ගණන් කැඳවීම.

සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව සතු සියඹලාණ්ඩුව,දොඹගහවෙල,ඇතිමලේ , පල්ලේවෙල යන සති පොළවල් සහ බදු දෙනු ලබන අනෙකුත් දේපල 2025 වර්ෂයේ ජනවාරි මස 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා බදු දීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

- **ප්‍රසම්පාදන අයදුම්පත් නිකුත් කිරිම :- 2024.10.24 සිට 2024.11.05 ප.ව.2.00 දක්වා.**
- **අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය :- 2024.11.06 පෙ.ව.10.00 දක්වා.**
- **ප්‍රසම්පාදන අයදුම් පත් විවෘත කරන දිනය:- 2024.11.06 දින පෙ.ව.10.30 .**
- **ප්‍රසම්පාදන පත් විවෘත කරන ස්ථානය :- සියඹලාණ්ඩුව ප්‍රාදේශිය සභා ප්‍රධාන කාර්යාලය**

**01.උප ලේඛනය**

| අනු අංකය | විස්තරය | ආපසු නොගෙවන ප්‍රසම්පාදන පෝරම ගාස්තු(රු:) | ආපසු ගෙවන ලංසු ඇප තැන්පත් මුදල (රු:) | අවම ලංසු මුදල (රු:) |
|---|---|---|---|---|
| 01 | සියඹලාණ්ඩුව සති පොළ | 5,000.00 | 25,000.00 | 3,407,000.00 |
| 02 | දොඹගහවෙල සති පොළ | 5,000.00 | 25,000.00 | 2,500,000.00 |
| 03 | පල්ලේවෙල සති පොළ | 5,000.00 | 25,000.00 | 3,539,000.00 |
| 04 | ඇතිමලේ සති පොළ | 5,000.00 | 25,000.00 | 2,127,000.00 |
| 05 | වාහන සේවා මධ්‍යස්ථානය (බදු දිමේ කාලය වසර 03කි) | 1,000.00 | 10,000.00 | 480,000.00 |
| 06 | සියඹලාණ්ඩුව පොළ භූමියේ පොදුවැසිකිළිය (එක් වර්ෂයක් සඳහා) | 1,000.00 | 2,000.00 | 48,000.00 |
| 07 | දොඹගහවෙල සති පොළ භූමියේ පොදු වැසිකිළිය(එක් වර්ෂයක් සඳහා) | 1,000.00 | 2,000.00 | 48,000.00 |

02.**ප්‍රසම්පාදන කොන්දේසි**

ව්‍යාපාරික කටයුතු සඳහා භාවිතයට ගනු පිණිස ''ස්ථානය තිබෙන තත්වයෙන්ම තැබිය යුතු ය''යන පදනමින් සති පොළ බදු ගැනිම සඳහා මොණරාගල දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවන්ට හා ලියාපදිංචි ස්වේච්ඡා සංවිධාන (ග්‍රාමෝදය මණ්ඩලය / ග්‍රාම සංවර්ධන සමිති / සමෘද්ධිය සමිතිය /සමුපකාර සමිති) වලට පමණක් ප්‍රසම්පාදන ඉල්ලුම් පත් ඉදිරිපත් කළ හැකි අතර, මෙම බල ප්‍රදේශයෙන් පිටත අයදුම්කරුවන්ගේ සහ අසාධු ලේඛන ගත වු පුද්ගලයින් අයදුම්පත් සලකා බලනු නොලැබේ.

03). ඉහත උප ලේඛනයේ සඳහන් ගාස්තු ගෙවිමෙන් පසු පිටපත් දෙකක් සහිත ඉල්ලුම් පත්‍ර මෙම කාර්යාලයෙන් නිකුත් කරනු ලැබේ

04). මුදල් ගෙවා ලබා ගන්නා ලද ප්‍රසම්පාදන ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කර ,**මුල් පිටපත හා අනු පිටපත වෙන් වෙන් වශයෙන් කවර දෙකක දමා ඉල්ලුම්පත් බහාලූ කවර දෙකම එකම කවරයක දමා මුද්‍රා තබා /නොගැලවන සේ අලවා සහා ලේකම් ,ප්‍රාදේශිය සභාව ,සියඹලාණ්ඩුව**. යන ලිපිනයට නියමිත වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් හෝ කාර්යාලයේ ලබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය.

05) ටෙන්ඩර් අයදුම් කළ යුත්තේ මෙම කාර්යාලයෙන් නිකුත් කරනු ලබන අයදුම්පතක් මඟිනි.එක් එක් දේපල සඳහා වෙන වෙනම අයදුම් කළ යුතුය.අයදුම්පතේ ඡායා පිටපත් ඉදිරිපත් නොකළ යුතුය.

06) ප්‍රමාද වී ලැබෙන හා තැපැලේදී අස්ථානගත වන ටෙන්ඩර්පත් වලට සියඹලාණ්ඩුව ප්‍රාදේශිය සභාව වග කියනු නොලැබෙන අතර ,ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන දේපලෙහි නම සඳහන් කළ යුතුය.

07).උප ලේඛනයේ දැක්වෙන දේපල එහි සඳහන් අවම ලංසුවට වඩා වැඩි මුදලකට ඉල්ලුම් කළ යුතු අතර ,අවම ලංසු මුදලට වඩා අඩු ටෙන්ඩර් ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කර ඇප තැන්පත් මුදල් සභාව සතු කරනු ලැබේ.

08).මෙම කාර්යාලයට ඇප මුදල් හා ටෙන්ඩර් පෝරම ගාස්තු ගෙවා ටෙන්ඩර් ඉල්ලුම්පත්‍ර ලබාගෙන ටෙන්ඩර් ඉදිරිපත් නොකරන අයගේ ඇප මුදල් හා පෝරම ගාස්තු ආපසු නොගෙවන අතර ,පළාත් පාලන ආයතනය සතු දේපළ පිරිනැමීම පිළිබඳ සාර්ථක ලංසුකරු වෙත දැනුම් දීමෙන් පසු දින 07 ඇතුළත සාර්ථක ලංසුකරු අදාළ ලංසු මුදලින් 25% වන ආපසු ගෙවනු ලබන (පොළී රහිත) ගිවිසුම් ඇප තැන්පත් මුදල පළාත් පාලන ආයතනයේ තැන්පත් කර ගිවිසුම් ගත විය යුතුය.ගිවිසුම් ඇප මුදල් තැන්පත් කිරිමට අපොහොසත් වන අයගේ ටෙන්ඩර් ඇප තැන්පත් සභාව සතු කරන අතර ,ඔවුන්ගේ නම් අසාධු ලේඛන ගත කරනු ලැබේ.

09) පොදු වැසිකිළිය සඳහා ඉල්ලුම් කරන ප්‍රසම්පාදනකරුවන් වැසිකිළිය පිරිසිදු කිරිමට ගන්නා උපකරණ හා විෂබීජ නාශක තමා විසින්ම සපයා ගත යුතු අතර ,වැසිකිළි වල පිරිසිදු කිරිම සඳහා ගලි සේවාව බදුකරුගේ වියදමින් කළ යුතුය.

10) පොදු වැසිකිළිය භාවිතා කරන සේවාලාභින්ගෙන් එක් වතාවක සඳහා අයකළ යුතු වන්නේ රු.30 ක් ද වේ.

11).සියඹලාණ්ඩුව ප්‍රාදේශිය සභාව විසින් තීරණයකර ලබා දෙනු ලබන ගාස්තු ප්‍රමාණය පමණක් වෙළඳුන්ගෙන් අයකිරිමට ටෙන්ඩරය පිළිගත් බදුකරුවන් බැඳි සිටි.

12) ලැබෙන ලද ප්‍රසම්පාදන ඉල්ලුම්පත් 2024.11.06 දින පෙ.ව10.30 ට සියඹලණ්ඩුව ප්‍රාදේශිය සභා කාර්යාලයේදි විවෘත කරනු ලැබේ.ඒ සඳහා ප්‍රසම්පාදන ඉල්ලුම්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැක.ඉල්ලුම්කරු වෙනුවට නියෝජිතයෙකුට සහභාගි වන්නේ නම් ඉල්ලුම්කරුගේ ලිඛිත අවසරයක් තිබිය යුතුය.(අසාධු ලේඛනගත වු පුද්ගලයින්ට ප්‍රසම්පාදන ඉල්ලුම්පත් විවෘත කරන අවස්ථාවට සහභාගි විය නොහැකිය.)

13) නැවත ගෙවන ලංසු ගාස්තුව නිදහස් කිරිම වෙනුවෙන් නිකුත් කරන ලද කුවිතාන්සියේ මුල් පිටපත සියඹලාණ්ඩුව ප්‍රාදේශිය කාර්යාලයට ඉදිරිපත් කරන අවස්ථාවේදි රැගෙන ආ යුතු ය.

14) සෑම ලංසුකරුවකුම ප්‍රසම්පාදන පෝරම ගාස්තු හා ඇප තැන්පත් ගෙවිමෙන් ලංසු ලියවිල්ල ලබා ගැනිමට පෙර ස්වකීය අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පතෙහි පිටපතක් හා පදිංචිය තහවුරු කිරීම සඳහා ග්‍රාම සහතිකයක් ද ඉදිරිපත් කළ යුතුය.(මාස 06ක් ඇතුළත ලබා ගත්)

15) පළාත් පාලන ආයතනය විසින් නිකුත් කරන ලද ලංසු ලියවිල්ල මිලට ගත් බවට සනාථ වන ලංසු පමණක් ප්‍රසම්පාදන කමිටුව විසින් පිළිගන්නා අතර අනෙකුත් ලංසු පත් ප්‍රතික්ෂේප කෙරේ.

16)ලංසු කරුවෙකු වෙත ලබා දෙන ලංසු ලියවිල්ල මොනයම් හේතුවක් නිසාවත් වෙනත් පාර්ශවයක භාවිතය සඳහා ලබා නොදිය යුතුය.

17).අදාළ දේපළ පිහිටි ස්ථාන වෙත යාම ආශ්‍රිත පිරිවැය හා වියදම ද ඇතුළුව ලංසු ලියවිලි පිළියෙළ කිරිම හා භාරදීම ආශ්‍රිතව ලංසුකරුවන් හට ඇති වු පිරිවැය හා වියදම් සඳහා සියඹලාණ්ඩුව ප්‍රාදේශිය සභාව වගකිම නොදරනු ඇත.

18).වැඩි විස්තර කාර්යාල වේලාව තුළ කාර්යාලයට පැමිණ හෝ දුරකථන අංක 055-2279166, 055-2277536 ඇමතීමෙන් ලබාගත හැකිය.

2024.10.23 වන දින

ඩී.එම්.අනුර දිසානායක,
සභා ලේකම්
ප්‍රාදේශිය සභාව, සියඹලාණ්ඩුව.